ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1982 අංක 51 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 දෙසැම්බර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 දෙසැම්බර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 20 යි  තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 51 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 දෙසැම්බර් මස 30 වන දින]

එල්. ඩී.—ඕ. 55/82

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1982 අංක 51 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** 1980 අංක 54 දරන පනතින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තියේ "1982 දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන්" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1984 දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන්" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයෙහි 20 වන විෂයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් විෂයයන් එකතු කිරීමෙන්, ඒ උපලේඛනය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

| | |
|---|---|
| "21. කැලෑ ආඥාපනතේ 7(ඇ) වගන්තිය. | කැලෑ ආඥාපනතේ 3 වන වගන්තියෙන් ප්‍රකාශයට පත් කරන ලද රක්ෂිත කැලෑවල අනවසරයෙන් ගස් කැපීම සහ අනවසරයෙන් මැණික් ගැරීම. |
| 22. විෂ වර්ග, අබින් සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 78 වන වගන්තිය සමග කියවිය යුතු ඒ ආඥාපනතේ 27 වන, 28 වන, 29 වන, 32 වන, 33 වන, 34 වන, 36 වන, 37 වන, 49 වන, 50 වන, 51 වන, 52 වන, 53 වන, 54 වන, 59(1) වන, 63 වන, 70 වන, 71 වන සහ 74 වන වගන්ති. | විෂ වර්ග, අබින් සහ අන්තරායදායක ඖෂධ වර්ග නීති විරෝධී ලෙස වගා කිරීම, සන්තකයෙහි තබා ගැනීම, විකිණීම, අපනයනය කිරීම යනාදිය මගින් වැරදි සිදු කිරීම.". |

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.